# විදේශීය නිරීක්ෂකයන් 15ක් ගෙන්වීමට පැෆරල් මැ.කො. සභාවෙන් අවසර ඉල්ලයි

■ එච්.අයි. තුෂාර

පාර්ලිමේන්තු මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා විදේශීය නිරීක්ෂකයන් පහළොවක් ගෙන්වීමට සැලසුම් කර තිබෙන බවත්, ඒ සඳහා මැතිවරණ කොමිසමේ අවසරය ඉල්ලූ බවත් ආසියානු මැතිවරණ නිරීක්ෂක ජාලයේ මහලේකම්, පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

ආසියානු මැතිවරණ නිරීක්ෂණ ජාලය ලෙස විදේශ නිරීක්ෂකයන් පහළොස්දෙනා කැඳවීමට සැලසුම් කර තිබෙන බවත්, ඔවුන් කෝවිඩ්-19 අඩුවෙන්ම පැතිර යන රටවලින් ගෙන්වීමට සැලසුම් කර තිබෙන බවත් ඒ මහතා පවසා සිටියේය.

ලංකාව තුළදී දින 14ක් නිරෝධායනයකට ලක්කර කෝවිඩ්-19 පරීක්ෂණය සිදුකිරීමෙන් පසු සෞඛ්‍ය උපදෙස් මත මෙම පිරිස් නිරීක්ෂණ කටයුතුවලට යොදා ගැනීමට සැලසුම් කර තිබෙන බවත්, මීට අමතරව දේශීය නිරීක්ෂකයන් හයදහසක් මැතිවරණ නිරීක්ෂණ කටයුතුවලට යොමුකරන බවත් රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවසීය.

කෝවිඩ්-19 සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් නිරීක්ෂණ කටයුතු සිදුකරන බවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම නිරීක්ෂණ කටයුතු මේ වනවිට ආරම්භ කර තිබෙන බවත් හෙතෙම ප්‍රකාශ කළේය.